४ तौ पिबतः।	4. ඔවුහු දෙදෙන නිදත්.
५ तौ तिष्ठतः।	5. ඔවුහු දෙදෙන නඟිත්.
६ तौ गच्छतः।	6. ඔවුහු දෙදෙන බසිත්.
७ ते निषीदन्ति।	7. ඔවුහු ගෙන යත්.
८ ते उपदिशन्ति।	8. ඔවුහු බලත්.
९ ते यच्छन्ति।	9. ඔවුහු දුවත්.

8.4 අභ්‍යාසය

පහත සඳහන් සංස්කෘත මධ්‍යම පුරුෂ වාක්‍ය සිංහලයට පරිවර්තනය කරමු. සිංහල මධ්‍යම පුරුෂ වාක්‍ය සංස්කෘතයට පරිවර්තනය කරමු.

१ त्वं भवसि।	1. නුඹ හිඳිහි.
२ त्वं पचसि।	2. නුඹ උසුලහි.
३ त्वं खादसि।	3. නුඹ වැටෙහි.
४ युवां पिबथः।	4. නුඹලා දෙදෙන නිදහු.
५ युवां तिष्ठथः।	5. නුඹලා දෙදෙන නඟිහු.
६ युवां गच्छथः।	6. නුඹලා දෙදෙන බසිහු.
७ यूयं निषीदथ।	7. නුඹලා ගෙන යහු.
८ यूयं उपदिशाथ।	8. නුඹලා බලහු.
९ यूयं यच्छथ।	9. නුඹලා දුවහු.

8.5 අභ්‍යාසය

පහත සඳහන් සංස්කෘත උත්තම පුරුෂ වාක්‍ය සිංහලයට පරිවර්තනය කරමු. සිංහල උත්තම පුරුෂ වාක්‍ය සංස්කෘතයට පරිවර්තනය කරමු.

१ अहं भवामि ।	1. මම හිඳිමි.
२ अहं पचामि ।	2. මම වඳිමි.
३ अहं खादामि ।	3. මම වැටෙමි.
४ आवां पिबावः ।	4. අපි දෙදෙන නිදමු
५ आवां तिष्ठावः ।	5. අපි දෙදෙන නගිමු.
६ आवां गच्छावः ।	6. අපි දෙදෙන බසිමු.
७ वयं निषीदामः ।	7. අපි ගෙන යමු.
८ वयं उपदिशामः ।	8. අපි බලමු.
९ वयं यच्छामः ।	9. අපි දුවමු.
१० वयं पठामः ।	10. අපි පාඩම් කරමු.

8.6 අභ්‍යාසය

❖ හයවන පාඩමේ 6.1 රූපයේ ඇති අකාරාන්ත ඒකවචන නාමපද වර්තමාන කාල ඒකවචන ක්‍රියාපද සමග එකතු කර වචන දෙකේ වාක්‍ය **දොළහක්** ලියන්න.

❖ එම වාක්‍ය ද්විවචන, බහුවචනවලට හරවා ලියන්න.

09 පාඩම
नवमः पाठः

නාම වර නැඟීම -II
(අකාරාන්ත පුරුෂලිංග कुमार ශබ්දය)

9.1 ක්‍රියාකාරකම

අකාරාන්ත පුරුෂලිංග **कुमार** ශබ්දය වාචෝද්ගත කරමු.

विभक्ति	एकवचन	द्विवचन	बहुवचन
प्रथमा	कुमारः	कुमारौ	कुमाराः
सम्बोधन	हे कुमार	हे कुमारौ	हे कुमाराः
द्वितीया	कुमारम्	कुमारौ	कुमारान्
तृतीया	कुमारेण	कुमाराभ्याम्	कुमारैः
चतुर्थी	कुमाराय	कुमाराभ्याम्	कुमारेभ्यः
पञ्चमी	कुमारात्	कुमाराभ्याम्	कुमारेभ्यः
षष्ठी	कुमारस्य	कुमारयोः	कुमाराणाम्
सप्तमी	कुमारे	कुमारयोः	कुमारेषु

9.2 ක්‍රියාකාරකම

(कुमार) ශබ්දයට සමාන ශබ්ද වාචෝද්ගත කර වරනඟමු.

पालक	පාලකයා	नाविक	නැවියා
कपोत	පරවියා	कुक्कुट	කුකුළා
कृषीवल	ගොවියා	शृगाल	සිවලා

जनक	පියා	नायक	නායකයා
नर	මිනිසා	भट	භටයා
सिंह	සිංහයා	चटक	ගේකුරුල්ලා
बिडाल	බළලා	सारमेय	බල්ලා
वृद्ध	මහල්ලා	उपासक	උපාසකයා
मार्ग	මාර්ගය	छात्र	ශිෂ්‍යයා

9.1 අභ්‍යාසය

පහත සඳහන් නාමපදවල විභක්තිය, වචනය සහ තේරුම ලියමු.

	විභක්තිය	වචනය	තේරුම
උදා: काकाः	ප්‍රථමා	බහුවචන	කපුටෝ
१ बालकः	....	....	....
२ बालकयोः	....	....	....
३ बालकेन	....	....	....
४ बालकैः	....	....	....
५ वृक्षे	....	....	....
६ कुमारेषु	....	....	....
७ शुकानाम्	....	....	....
८ देवाभ्याम्	....	....	....
९ गजम्	....	....	....
१० अजे	....	....	....

११ उपासकेन	....	....	....
१२ काकयोः	....	....	....
१३ शुनकाय	....	....	....
१४ काकेषु	....	....	....
१५ सारमेयम्	....	....	....
१६ काकाभ्याम्	....	....	....
१७ मूर्खात्	....	....	....
१८ मूर्खाः	....	....	....
१९ दासानाम्	....	....	....
२० चटकम्	....	....	....

පහත සඳහන් වාක්‍ය උගනිමු.

❖ तत् ශබ්දයේ පුල්ලිංග ප්‍රථමා විභක්ති ඒකවචන, ද්විවචන, බහුවචන නාමපද වාක්‍යයක තනි ව යෙදුණු විට सः හෙතෙම, तौ ඔවුහු දෙදෙන, ते ඔවුහු යනුවෙන් අර්ථ ප්‍රකාශ වෙයි.

सः गच्छति । හෙතෙම යයි.

तौ पठतः । ඔවුහු දෙදෙනා පාඩම් කරත්.

ते क्रीडन्ति । ඔවුහු ක්‍රීඩා කරති.

❖ නාමපදයට විශේෂණ ව सः, तौ, ते යෙදුණු විට එම පදවල අර්ථය පොදුවේ ''ඒ'' යනුවෙන් ප්‍රකාශ වෙයි.

सः पुरुषः गच्छति ।	ඒ මිනිසා යයි.
तौ छात्रौ पठतः ।	ඒ ශිෂ්‍යයෝ දෙදෙනා පාඩම් කරත්.
ते बालकाः क्रीडन्ति ।	ඒ ළමයි ක්‍රීඩා කරති.

9.2 අභ්‍යාසය

පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලයට නගන්න.

१ सः तिष्ठति ।
२ सः खादति ।
३ तौ पिबतः ।
४ तौ वहतः ।
५ ते यच्छन्ति ।
६ ते क्रीडन्ति ।
७ सः बालकः हसति ।
८ सः वानरः खादति ।
९ तौ अश्वौ धावतः ।
१० तौ शुकौ कूजतः ।
११ ते सूदाः पचन्ति ।
१२ ते बालकाः क्रीडन्ति ।

9.3 අභ්‍යාසය

පහත සඳහන් සිංහල වාක්‍ය සංස්කෘතයට නගන්න.

1. ළමයා සිනාසෙයි.
2. ඒ ළමයා දුවයි.
3. හෙතෙම පාඩම් කරයි.

4. ඒ පුරුෂයෝ දෙදෙන ගෙනයත්.

5. ඔවුහු දෙදෙන පාඩම් කරත්.

6. කුමාරවරු පාඩම් කරති.

7.ගිරවා පියාඹයි.

8. දෙවියා සිටියි.

9. දෙවිවරු දෙදෙන සිටිත්.

10. ඒ දෙවිවරු සිටිති.

11. එළුවා කයි.

12. එළුවෝ දෙදෙන කත්.

13. ඒ එළුවෝ කති.

14. ඒ වඳුරා නඟියි.

15. වඳුරෝ දෙදෙන නඟිත්.

16. වඳුරෝ නඟිති.

17. ඒ සොරු දෙදෙන යත්.

18. යෝධයෝ උසුලති.

19. ඒ ගොන්නු කති.

20. ඔවුහු පිසත්.

10
පාඩම
दशमः पाठः

इदम्, किम् ශබ්ද ප්‍රථමා විභක්ති පද

10.1 ක්‍රියාකාරකම

इदम् किम् පුරුෂලිංග ශබ්දවල ප්‍රථමා විභක්ති පද වාචෝද්ගත කරමු.

शब्द	विभक्ति	एकवचन	द्विवचन	बहुवचन
इदम्	प्रथमा विभक्ति	अयं	इमौ	इमे
किम्	प्रथमा विभक्ति	कः	कौ	के

अयं	इमौ	इमे
මෙතෙම	මොවුහු දෙදෙන	මොවුහු
कः	कौ	के
කවරෙක් ද?	කවර දෙදෙනෙක් ද?	කවරහු ද?

පහත සඳහන් වාක්‍ය හඳුනාගනිමු.

अयं कः ?	මෙතෙම කවරෙක් ද?
अयं अजः	මේ එළුවෙකි.
अयं कः ?	මෙතෙම කවරෙක් ද?
अयं बालकः	මේ ළමයෙකි.
कौ इमौ ?	මොවුහු දෙදෙන කවර දෙදෙනෙක් ද?
इमौ बालकौ	මොවුහු දෙදෙන ළමයි දෙදෙනෙකි.

कौ इमौ ?	මොවුහු දෙදෙන කවර දෙදෙනෙක් ද?
इमौ गजौ	මොවුහු ඇත්තු දෙදෙනෙකි.
के इमे ?	මොවුහු කවරහු ද?
इमे वृषभाः	මොවුහු ගොන්නු ය.
के इमे ?	මොවුහු කවරහු ද?
इमे अश्वाः	මොවුහු අශ්වයෝ ය.

පහත සඳහන් වාක්‍ය හඳුනාගනිමු.

❖ **इदम्** පුරුෂලිංග ශබ්දයේ ප්‍රථමා විභක්ති ඒකවචන, ද්විවචන, බහුවචන නාමපද වාක්‍යයක තනි ව යෙදුණු විට **अयं** මෙතෙම **इमौ** මොවුහු දෙදෙන **इमे** මොවුහු යනුවෙන් අර්ථ ප්‍රකාශ වෙයි.

अयं खादति ।	මෙතෙම කයි.
इमौ पठतः ।	මොවුහු දෙදෙනා පාඩම් කරත්.
इमे क्रीडन्ति ।	මොවුහු ක්‍රීඩා කරති.

❖ ලිංග, විභක්ති, වචනවලට සමාන ව නාමපදයට විශේෂණ ව **अयं, इमौ, इमे** යෙදුණු විට එම පදවල අර්ථය පොදුවේ ''මේ'' යනුවෙන් ප්‍රකාශ වෙයි.

अयं पुरुषः खादति ।	මේ මිනිසා කයි.
इमौ छात्रौ पठतः ।	මේ ශිෂ්‍යයෝ දෙදෙනා පාඩම් කරත්.
इमे बालकाः क्रीडन्ति ।	මේ ළමයි ක්‍රීඩා කරති.

10.1 අභ්‍යාසය

පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලයට නඟමු.

अयं कः ? अयं बुद्धः ।
अयं कः ? अयं बालकः ।

कौ इमौ ? इमौ धनिकौ ।
कौ इमौ ? इमौ गजौ ।

के इमे ? इमे पुत्राः ।
के इमे ? इमे मूर्खाः ।

10.2 අභ්‍යාසය

වරහන් තුළ ඇති පහත සඳහන් පද සුදුසු පරිදි යොදා හිස් තැන් පුරවන්න.

(सः/ते/युवां/अहं/तौ/त्वं/वयं/यूयं/आवां/अयं/इमे/इमौ)

1. .... तिष्ठति ।
2. .... निषीदामि ।
3. .... हसतः ।
4. .... पुरुषः ।
5. .... पश्यामः ।
6. .... गच्छन्ति ।
7. .... पिबथ ।
8. .... गजाः ।
9. .... शुनकौ ।
10. .... धावति ।
11. .... खादथः ।
12. .... उपदिशावः

11
පාඩම
एकादशः पाठः

උක්තපද හා ක්‍රියාපද යොදා වාක්‍ය තැනීම

11.1 ක්‍රියාකාරකම

වර්තමාන කාල (लट् - लकार) ක්‍රියා පද වාචෝද්ගත කරන්න.

पुरुष	एकवचन	द्विवचन	बहुवचन
प्रथमपुरुष	जयति දිනයි	जयतः (දෙදෙන) දිනත්	जयन्ति දිනති
मध्यमपुरुष	जयसि දිනහි	जयथः (දෙදෙන) දිනහු	जयथ දිනහු
उत्तमपुरुष	जयामि දිනමි	जयावः (දෙදෙන) දිනමු	जयामः දිනමු

11.2 ක්‍රියාකාරකම

පහත සඳහන් ක්‍රියාපද වාචෝද්ගත කරමු.

१ नमति - වඳියි
२ वहति - උසුලයි
३ ताडयति - තළයි
४ जयति - දිනයි
५ प्रहरति - පහර දෙයි
६ रक्षति - රකියි
७ उपविशति - හිඳගනියි
८ प्रेषयति - යවයි
९ कुप्यति - කිපෙයි
१० असूयति - ඊර්ෂ්‍යා කරයි
११ तुष्यति - සතුටු වෙයි
१२ निर्गच्छति - නික්මෙයි

१३ प्रभवति	- හටගනියි	१९ अनुतिष्ठति	- අනුව පවතියි.
१४ विलसति	- බබළයි	२० रवति	- නාද කරයි
१५ उत्तिष्ठति	- නැගිටියි	२१ क्षिपति	- බහාලයි/විසි කරයි
१६ वपति	- වපුරයි	२२ विलुठति	- පෙරළෙයි
१७ अवतरति	- බසියි	२३ छादयति	- වසයි
१८ कर्षति	- සීසායි	२४ स्निह्यति	- සෙනෙහෙ කරයි

ප්‍රථමා විභක්තිය හඳුනාගනිමු.

❖ වාක්‍යයක ක්‍රියාවෙන් කියැවෙන පදය **උක්තය යි. උක්තය** යෙදෙන්නේ ප්‍රථමා විභක්තියෙනි. වාක්‍යයක ක්‍රියාපදය යෙදිය යුත්තේ එම වාක්‍යයේ උක්තපදය අයත් වන වචනයට හා පුරුෂයට සමාන ව ය.

❖ **बालः पठति।** (ළමයා පාඩම් කරයි.) මෙම වාක්‍යයේ **बालः** යන උක්තය ප්‍රථමා විභක්ති, ප්‍රථම පුරුෂ ඒකවචන පදයකි. එනිසා ක්‍රියාපදය ද **पठति** යන ප්‍රථම පුරුෂ ඒකවචනයෙන් යෙදී ඇත. ද්වි වචන, බහුවචනවල දී ද මෙම ක්‍රමය අනුගමනය කළ යුතු වෙයි.

උදාහරණ:- ප්‍ර:පු: ද්විවචන - कुमारौ धावतः।
කුමාරයෝ දෙදෙනා දුවත්.

ම:පු: ඒකවචන - त्वं धावसि।
නුඹ දුවහි.

උ:පු: ඒකවචන - अहं धावामि।
මම දුවමි.

11.1 අභ්‍යාසය

පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලයට පරිවර්තනය කරන්න.

१ पालकः रक्षति ।

२ उपासकः नमति ।

३ नरः हसति ।

४ बालकः पठति ।

५ त्वं तुष्यसि ।

६ वृषभौ खादतः ।

७ अहं पश्यामि ।

८ कृषीवलः निर्गच्छति ।

९ काकः निर्गच्छति ।

१० आवां पश्यावः ।

११ कलन्दकाः पतन्ति ।

१२ योधाः वहन्ति ।

१३ युवां तुष्यथः ।

१४ वृक्षौ फलतः ।

१५ यूयं तुष्यथ ।

१६ वयं पश्यामः ।

१७ जनकः स्निह्यति ।

१८ कुक्कुटाः भुञ्जन्ति

१९ भटाः उत्तिष्ठन्ति ।

२० नायकाः विलसन्ति ।

11.2 අභ්‍යාසය

පහත සඳහන් සිංහල වාක්‍ය සංස්කෘතයට පරිවර්තනය කරන්න.

1. පාලකයා රකියි.

2. මිනිස්සු සතුටු වෙත්.

3. සෙබළු දිනත්.

4. පරෙවියා ගෙන යයි.

5. මහල්ලෝ රකිත්.

6. බල්ලෝ දෙදෙන රකිත්.

7. හිරු බබළයි.

8. කුකුල්ලු කිපෙත්.

9. ගොවියෝ සීසාත්.

10. යෝධයා පහර දෙයි.

11. උපාසකයෝ දෙදෙන වඳිත්.

12. නැවියෝ දෙදෙන යති.

13. සිවල්ලු දෙදෙන නික්මෙත්.

14. නායකයෝ දෙදෙන ඊර්ෂ්‍යා කරත්.

15. සිංහයෝ නාද කරත්.

16. පියවරු සෙනෙහෙ කරත්.

17. රථය පෙරළෙයි.

18. පුරුෂයෝ දෙදෙන හෙලත්.

19. ගොවියෝ දෙදෙන වපුරත්.

20. සිවල්ලු බසිත්.

12
පාඩම
द्वादशः पाठः

නාම වරනැගීම – III

(ඉකාරාන්ත පුරුෂලිංග मुनि ශබ්දය)

12.1 ක්‍රියාකාරකම

ඉකාරාන්ත පුරුෂලිංග **मुनि** ශබ්දය වාචෝද්ගත කරමු.

विभक्ति	एकवचन	द्विवचन	बहुवचन
प्रथमा	मुनिः	मुनी	मुनयः
सम्बोधन	हे मुने	हे मुनी	हे मुनयः
द्वितीया	मुनिम्	मुनी	मुनीन्
तृतीया	मुनिना	मुनिभ्याम्	मुनिभिः
चतुर्थी	मुनये	मुनिभ्याम्	मुनिभ्यः
पञ्चमी	मुनेः	मुनिभ्याम्	मुनिभ्यः
षष्ठी	मुनेः	मुन्योः	मुनीनाम्
सप्तमी	मुनौ	मुन्योः	मुनिषु

12.2 ක්‍රියාකාරකම

(मुनि) ශබ්දයට සමාන ශබ්ද වාචෝද්ගත කර වරනගමු.

१	कपि	- වඳුරා	७	सारथि	- රියදුරා
२	अधिपति	- අධිපතියා	८	अहि	- සර්පයා
३	अरि	- සතුරා	९	अलि	- බඹරා
४	यति	- භික්ෂුව	१०	रवि	- හිරු
५	मणि	- මැණික	११	असि	- කඩුව
६	गिरि	- කන්ද	१२	भूपति	- රජතුමා

१३ जलधि	- මුහුද	१७ गृहपति	- ගෙහිමියා
१४ अग्नि	- ගින්න	१८ छेदि	- වඩුවා
१५ इभारि	- සිංහයා	१९ निशापति	- සඳ
१६ तिमि	- මාළුවා	२० घोटारि	- මීමා

12.1 අභ්‍යාසය

(मुनि) ශබ්දයට සමාන ශබ්දවල විභක්තියට අදාළ වචන යොදා හිස් තැන් පුරවන්න.

शब्दाः	विभक्ति	एकवचन	द्विवचन	बहुवचन
कपि	प्रथमा	कपिः		कपयः
गिरि	प्रथमा		गिरी	
अरि	सम्बोधन	हे अरे		
असि	सम्बोधन		हे असी	
मणि	द्वितीया	मणिम्		
रवि	द्वितीया		रवी	
यति	तृतीया	यतिना		
अलि	तृतीया			अलिभिः
अधिपति	चतुर्थी	अधिपतये		
सेनापति	चतुर्थी		सेनापतिभ्याम्	
मुनि	पञ्चमी	मुनेः		
गिरि	पञ्चमी			गिरिभ्यः
अहि	षष्ठी			अहीनाम्
अग्नि	षष्ठी		अग्नयोः	
भूपति	सप्तमी	भूपतौ		
घोटारि	सप्तमी			घोटारिषु



12.1 රූපය

12.2 අභ්‍යාසය

1. 12.1 රූපය පරීක්ෂා කොට බලා ඒ අනුව ඉකාරාන්ත නාමපදවල ඒකවචන ලියන්න.
2. එම ඒකවචන නාම පද ද්විවචන, බහුවචනවලට හරවන්න.
3. 12.1 අභ්‍යාසයෙන් ප්‍රකාශ වන ක්‍රියාපදවල ඒකවචන ලියන්න.
4. එම ඒකවචන ක්‍රියාපද ද්විවචන, බහුවචනවලට හරවන්න.
5. 12.1 අභ්‍යාසයේ ඇති ඉකාරාන්ත ඒකවචන නාමපද ඒකවචන ක්‍රියා පද සමග ගළපා වචන දෙකේ වාක්‍ය **දහයක්** ලියන්න.
6. එම ඒකවචන වාක්‍ය ද්විවචන, බහුවචනවලට හරවා ලියන්න.

සම්බෝධන විභක්තිය හඳුනාගනිමු.

- **ආමන්ත්‍රණය** සම්බෝධන විභක්තියෙන් යෙදේ. **ආමන්ත්‍රණය** නම් කෙනකු ඇමතීම යි. මෙය හඳුනාගැනීමට **हे** යන නිපාතය මුලට යෙදේ.

  हे बालक - පින්වත් ළමය,

  हे बालकौ - පින්වත් ළමයි දෙදෙනෙනි,

  हे बालकाः - පින්වත් ළමයිනි,

- ඇමතීමත් සමග ම අණ කිරීම (විධානය) සිදු කරයි. එය විධාන ක්‍රියාව වශයෙන් හැඳින්වේ. විධාන ක්‍රියාව සාදාගන්නා පහසු ක්‍රමයක් නම්

  1. වර්තමාන කාල, ප්‍රථම පුරුෂ, ඒකවචන ක්‍රියාවේ "**ति**" ඉවත් කරන්න.
  2. ක්‍රියාවේ ඉතිරි කොටස විධාන ක්‍රියා මධ්‍යමපුරුෂ ඒකවචනය යි.

  पठति > **पठ** = **पठ** පාඩම් කරන්න = පාඩම් කරව.

3. එම ඒකවචන විධාන ක්‍රියාවට ''तम्'' එකතු කළ විට මධ්‍යම පුරුෂ ද්විවචනය සෑදේ.

पठ + तम् - पठतम् දෙදෙන පාඩම් කරවු.

4. එම ඒකවචන විධාන ක්‍රියාවට ''त'' එකතු කළ විට මධ්‍යම පුරුෂ බහුවචනය සෑදේ.

पठ + त - पठत - පාඩම් කරවු.

12.3 අභ්‍යාසය

පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලට නඟන්න.

१ हे कुमार, पठ ।

२ हे बालकौ, धावतम् ।

३ हे पुरुषाः, गच्छत ।

४ हे वानर, त्वं खाद ।

५ हे शुनकौ, युवां वहतम् ।

६ हे शुकाः, कूजत ।

७ हे बालकाः, यूयं नमत ।

८ हे गजौ, युवां खादतम् ।

९ हे सूदाः, यूयं पचत ।

१० हे बिडाल, त्वं पिब ।

13
පාඩම
त्रयोदशः पाठः

නාම වරනැඟීම IV

(අකාරාන්ත නපුංසකලිංග फल ශබ්දය)

13.1 ක්‍රියාකාරකම

අකාරාන්ත නපුංසකලිංග **फल** ශබ්දය වාචෝද්ගත කරමු.

विभक्ति	एकवचन	द्विवचन	बहुवचन
प्रथमा	फलम्	फले	फलानि
सम्बोधन	हे फल	हे फले	हे फलानि
द्वितीया	फलम्	फले	फलानि
तृतीया	फलेन	फलाभ्याम्	फलैः
चतुर्थी	फलाय	फलाभ्याम्	फलेभ्यः
पञ्चमी	फलात्	फलाभ्याम्	फलेभ्यः
षष्ठी	फलस्य	फलयोः	फलानाम्
सप्तमी	फले	फलयोः	फलेषु

13.2 ක්‍රියාකාරකම

පහත සඳහන් වචන වාචෝද්ගත කරන්න. **फल** ශබ්දය සේ වරනගන්න.

१ कमल - පියුම
३ वन - වනය
२ पर्ण - කොළය
४ पात्र - පාත්‍රය

५	गृह	-	ගෙය	१३	पुष्प	-	මල
६	मुख	-	මුහුණ	१४	कोटर	-	බෙනය
७	तृण	-	තණකොළ	१५	धन	-	ධනය
८	भोजन	-	ආහාර	१६	कुसुम	-	මල
९	नगर	-	නුවර	१७	उदक	-	ජලය
१०	वस्त्र	-	වස්ත්‍රය/ඇඳුම	१८	नेत्र	-	ඇස
११	चित्र	-	චිත්‍රය	१९	मित्र	-	මිතුරා
१२	लेखन	-	ලියුම	२०	उद्यान	-	උයන

13.3 ක්‍රියාකාරකම

කණ්ඩායම් දෙකකට බෙදී ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහනක් ලෙස පහත සඳහන් වචනවල විභක්තිය, වචනය සහ තේරුම සොයමු.

१	कमलम्	११	कोटरयोः
२	फलानि	१२	कुसुमेषु
३	मुखे	१३	पात्राभ्याम्
४	गृहात्	१४	विश्वाय
५	नगरेषु	१५	मित्रस्य
६	पर्णैः	१६	वस्त्रेषु
७	गृहाभ्याम्	१७	उदकात्
८	वनानाम्	१८	चित्रेभ्यः
९	पात्राय	१९	पर्णानि
१०	तृणेभ्यः	२०	हे फल

ද්විතීයා විභක්තිය හඳුනාගනිමු.

❖ **කර්මය** යනු කර්තෘගේ ක්‍රියාවට යටත් වන පදය යි. **කර්තෘ** ප්‍රථමා විභක්තියෙන් යෙදෙන විට **අනුක්ත කර්මය** ද්විතීයා විභක්තියෙන් යෙදේ.

උදාහරණ :- बालकः <u>पुस्तकम्</u> पठति ।- ළමයා <u>පොත</u> පාඩම් කරයි.

❖ ඉහත වාක්‍යයේ **बालकः** යනු කර්තෘ ය. **पठति** යනු ක්‍රියාව යි. කර්තෘගේ එම ක්‍රියාවට යටත් ව ඇත්තේ **पुस्तकम्** යන්න යි. එය කර්මය වන අතර ද්විතීයාවෙන් යෙදී ඇත.

13.1 අභ්‍යාසය

පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලයට නඟන්න.

१ नरः गृहं गच्छति ।

२ वृषभः तृणं खादति ।

३ अहम् ओदनं पचामि ।

४ वानराः वृक्षम् आरोहन्ति ।

५ सः जनकं नमति ।

६ जनकौ उदकम् आहरतः ।

७ वृषभः पर्णानि खादति ।

८ अलिः कुसुमं गच्छति ।

९ बालकः चित्रं पश्यति ।

१० बिडालः क्षीरं पिबति ।

13.2 අභ්‍යාසය

පහත සඳහන් සිංහල වාක්‍ය සංස්කෘතයට නඟන්න.

1. මිනිසා නගරයට යයි.
2. මිනිස්සු දෙදෙන නගරයට යත්.
3. මිනිස්සු නගරවලට යත්.
4. ගොන්නු තණකොළ කත්.
5. වඳුරෝ ගෙඩි කත්.
6. වඳුරෝ දෙදෙන ගෙඩි දෙක කත්.
7. අලියා වනයට යයි.
8. කුරුල්ලා ගසට එයි.
9. මිනිස්සු උයනට යති.
10. බල්ලා ජලය බොයි.

14
පාඩම
चतुर्दशः पाठः

නාම වරනැඟීම - V
(ඉකාරාන්ත පුරුෂලිංග कपि ශබ්දය)

14.1 ක්‍රියාකාරකම

ඉකාරාන්ත පුරුෂලිංග **कपि** ශබ්දය වාචෝද්ගත කරමු.

विभक्ति	एकवचन	द्विवचन	बहुवचन
प्रथमा	कपिः	कपी	कपयः
सम्बोधन	हे कपे	हे कपी	हे कपयः
द्वितीया	कपिम्	कपी	कपीन्
तृतीया	कपिना	कपिभ्याम्	कपिभिः
चतुर्थी	कपये	कपिभ्याम्	कपिभ्यः
पञ्चमी	कपेः	कपिभ्याम्	कपिभ्यः
षष्ठी	कपेः	कप्योः	कपीनाम्
सप्तमी	कपौ	कप्योः	कपिषु

14.2 ක්‍රියාකාරකම

कपि ශබ්දයට සමාන ශබ්ද වරනඟා වාචෝද්ගත කරමු.

१ **कवि** - පණ්ඩිතයා

२ **निधि** - නිධානය

३ **कृमि** - කෘමියා

४ **हरि** - විෂ්ණු

५ **पाणि** - අත

६ **सेनापति** - සෙනෙවියා

७ **जलधि** - මුහුද

८ **व्याधि** - ලෙඩ

९ छिदि - පොරව

१० असि - කඩුව

११ पपि - සඳ

१२ पति - ස්වාමියා

१३ नृपति - රජු

१४ भोगपति - ප්‍රදේශ පාලකයා

14.3 ක්‍රියාකාරකම

නිතර යෙදෙන ක්‍රියාපද කිහිපයක් හඳුනාගනිමු.

१ भषति - බුරයි

२ तरति - තරණය කරයි

३ प्रेषयति - යවයි

४ खनति - සාරයි

५ रचयति - රචනා කරයි

६ विलसति - බබළයි

७ आह्वयति - කැඳවයි

८ चोरयति - සොරකම් කරයි

९ ताडयति - තළයි

१० शंसति - පසසයි

14.1 අභ්‍යාසය

පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලයට නඟමු.

१ कविः नृपतिं शंसति ।

२ चोरः मणिं चोरयति ।

३ बालकाः पापिम् आह्वयन्ति ।

४ नृपतिः सूदं वदति ।

५ सारथयः रथान् नयन्ति ।

६ भोगपतिः निधिं खनति ।

७ कृमिः पर्णं खादति ।

८ बालकः कन्दुकं ताडयति ।

९ अहं लेखनं रचयामि ।

१० नृपतिः सेनापतीन् युद्धाय प्रेषयति ।

14.2 අභ්‍යාසය

පහත සඳහන් සිංහල වාක්‍ය සංස්කෘතයට නඟමු.

1. පණ්ඩිතයා අසපුවට යයි.
2. පණ්ඩිතයෝ දෙදෙන අසපුවට යත්.
3. පණ්ඩිතයෝ අසපුවට යත්.
4. ප්‍රදේශ පාලකයා ගම රකියි.
5. ප්‍රදේශ පාලකයෝ දෙදෙන ගම් දෙක රකිත්.
6. ප්‍රදේශ පාලකයෝ ගම් රකිත්.
7. නැවියා මුහුද තරණය කරයි.
8. නැවියෝ දෙදෙන මුහුද තරණය කරත්.
9. නැවියෝ මුහුද තරණය කරත්.
10. බල්ලා සඳට බුරයි.
11. බල්ලෝ දෙදෙන සඳට බුරත්.
12. බල්ලෝ සඳට බුරත්.

ගුරුතුමාගේ සහාය ඇති ව පහත සඳහන් ප්‍රහේලිකාව පුරවන්න.

अ 1		र 2	■	क 3	न 4	
	■	च 5	मु 6			■
	■	य 7		■	■	ए 8
र 9	व 10		■	औ 11		
■	रा	■	■		■	चा
म 12		क 13		■	द 14	
15	क		■	अ 16		क

හරහට

1. නො දිරයි යන අදහස ප්‍රකාශ වේ.
3. රත්රන්වලට කියන නමකි.
5. සෙබළාට කියන නමකි.
7. ඉදින් යන අර්ථ දෙන පදයකි.
9. නාද කරයි යන අදහස දෙයි.
11. දියේ හැදෙන යන අදහස දෙයි.
12. මරාමිණට කියන නමකි.
14. ගුහාව යන අදහස දෙයි.
15. සියල්ල යන අදහස ප්‍රකාශ කරයි.
16. වැඩි යන අර්ථය ප්‍රකාශ කරයි.

පහළට

1. පිඹුරාට කියන නමකි.
2. රචනා කරයි යන අදහස දෙයි.
3. කෙස්වලට කියන නමකි.
4. මිනිසාට කියන නමකි.
6. සඳ එළිය යන අර්ථ දෙයි.
8. තනි ව හැසිරෙන යන අදහස දෙයි.
10. දියමන්තියට කියන නමකි.
11. සැඩපහරට කියන නමකි.
12. බර යන අදහස දෙයි.
13. ගොළු බව හඟවන පදයකි.
14. දී කිරිවලට නමකි.

තෘතීයා විභක්තිය හඳුනාගනිමු.

❖ තෘතීයා විභක්තිය ප්‍රධාන වශයෙන් **'විසින්'**, **'කරණ කොට'** යන අර්ථ ප්‍රකාශ කිරීමට යෙදේ.

❖ තෘතීයා විභක්තියෙන් ප්‍රකාශ කෙරෙන **'විසින්'** යන්නෙහි අර්ථය පිළිබඳ ව ඉහළ පන්තිවල දී උගත හැකි ය.

❖ මෙහි දී **කරණාර්ථය** (කරණ කොටගෙන යන අර්ථය) පමණක් සැලකිල්ලට ගැනේ.

උදාහරණ:- **बालकः <u>हस्तेन</u> लिखति ।** ළමයා <u>අතින්</u> (අත කරණ කොටගෙන) ලියයි.

❖ මෙහි **हस्तेन** යන පදය කරණ කොටගෙන යන අර්ථයේ තෘතීයා විභක්තියෙන් යෙදී ඇත.



14.3 අභ්‍යාසය

පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලයට නඟන්න.

१ पुरुषः रथेन गच्छति ।

२ बिलालः कन्दुकेन क्रीडति ।

३ वृक्षः पुष्पैः विलसति ।

४ वानराः हस्ताभ्याम् खादन्ति ।

५ चोरः दण्डेन प्रहरति ।

६ आकाशः मेघैः विलसति ।

७ अहं हस्ताभ्याम् प्रदीपं धारयामि ।

८ शकटं चक्राभ्याम् गच्छति ।

९ तडागः पुष्पैः विलसति ।

१० दासः घटेन जलम् आनयति ।

15 පාඩම පञ्चदशः पाठः

අතීත කාල (ලඞ්) ක්‍රියා වරනැඟීම

15.1 ක්‍රියාකාරකම

අතීත කාල (ලඞ්) ක්‍රියාපද වාචෝද්ගත කරමු.

पुरुष	एकवचन	द्विवचन	बहुवचन
प्रथमपुरुष	अभवत् විය	अभवताम् දෙදෙන වූහ	अभवन् වූහ
मध्यमपुरुष	अभवः වූවෙහි	अभवतम् දෙදෙන වූවෙහු	अभवत වූවෙහු
उत्तमपुरुष	अभवम् වූයෙමි	अभवाव දෙදෙන වූයෙමු	अभवाम වූයෙමු

15.2 ක්‍රියාකාරකම

වර්තමාන කාල හා අතීත කාල ක්‍රියාපද හඳුනාගනිමින් වරනගමු.

भवति – වෙයි | अभवत् – විය

चोरयति – සොරකම් කරයි | अचोरयत् – සොරකම් කළේ ය

लिखति – ලියයි | अलिखत् – ලිව්වේ ය

वसति – වාසය කරයි | अवसत् – වාසය කළේ ය

गच्छति – යයි | अगच्छत् – ගියේ ය

नमति	–	වඳියි	अनमत्	–	වැන්දේ ය
फलति	–	පලදරයි	अफलत्	–	පලදැරුවේ ය
पश्यति	–	බලයි	अपश्यत्	–	බැලුවේ ය/දුටුවේ ය
पठति	–	පාඩම් කරයි	अपठत्	–	පාඩම් කළේ ය
विशति	–	පිවිසෙයි	अविशत्	–	පිවිසියේ ය
वदति	–	කියයි	अवदत्	–	කීවේ ය
खादति	–	කයි	अखादत्	–	කෑවේ ය
धावति	–	දුවයි	अधावत्	–	දිව්වේ ය
पिबति	–	බොයි	अपिबत्	–	බිව්වේ ය
तिष्ठति	–	සිටියි	अतिष्ठत्	–	සිටියේ ය

15.1 අභ්‍යාසය

පහත සඳහන් වචනවල පුරුෂය, වචනය, අර්ථය ලියන්න.

	පුරුෂය	වචනය	අර්ථය
උදා:- अताडयन्	ප්‍රථමපුරුෂ	බහුවචන	තැළූහ
१ अभवन्	....	....	....
२ अवसत	....	....	....
३ अलिखाव	....	....	....
४ अनमम्	....	....	....

५	अफलत्	....	....	....
६	अपठाम	....	....	....
७	अपश्यतम्	....	....	....
८	अविशत्	....	....	....
९	अतिष्ठः	....	....	....
१०	अवदम्	....	....	....
११	अगच्छत	....	....	....
१२	अधावाव	....	....	....
१३	अचोरयत्	....	....	....
१४	अक्रीडत्	....	....	....
१५	अधावताम्	....	....	....

15.2 අභ්‍යාසය

පහත සඳහන් වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.

१ सः पुरुषः भवति ।

२ वृक्षाः फलन्ति ।

३ योधौ युद्धाय गच्छतः ।

४ अहिः गृहं विशति ।

५ बिडालः उदकं पिबति ।

६ बालकः लेखनं लिखति ।

७ शिशुः गुरुं नमति ।

८ मुनिः आश्रमं गच्छति ।

९ ते चन्द्रं पश्यन्ति ।

१० वयं गिरिम् आरोहामः ।

චතුර්ථී සහ පඤ්චමී විභක්ති හඳුනාගනිමු.

❖ **සම්ප්‍රදානය**, චතුර්ථී විභක්තියෙන් යෙදේ. යමක් දීමේ දී එය ලබන්නා හඟවන පදය **සම්ප්‍රදානය යි.**

උදාහරණ:- **धनिकः याचकाय आहारं यच्छति ।**

ධනවතා හිඟන්නාට ආහාර දෙයි.

किङ्करः वृषभाय उदकं ददाति ।

මෙහෙකරුවා ගොනාට ජලය දෙයි.





❖ යමකින් ඉවත් වීම, යමක් කෙරෙන් බිය වීම යන අර්ථ පඤ්චමී විභක්තියෙන් ප්‍රකාශ කෙරේ.

උදාහරණ:- **वृक्षात् फलं पतति ।**

ගසෙන් ගෙඩිය වැටේ.

मूषिकः मार्जारात् त्रस्यति ।

මීයා බළලාගෙන් බිය වේ.





15.3 අභ්‍යාසය

වරහන් තුළ දී ඇති චතුර්ථී සහ පඤ්චමී විභක්ති පද යොදාගෙන පහත සඳහන් වාක්‍යවල හිස් තැන් පුරවන්න.

(कुमाराय / पुत्राय / गृहात् / आपनात् / वृक्षात् / मुनिभ्याम् / छात्राय / कपोताय / गुरोः / हस्तात्)

१ गुरुः .... पुस्तकं ददाति ।

२ जनकः .... मोदकं यच्छति ।

३ .... पत्राणि पतन्ति ।

४ वाणिजः .... निर्गच्छति ।

५ त्वं .... निर्गच्छसि ।

६ छात्रः .... अधिगच्छति ।

७ .... भाजनं पतति ।

८ अहं .... दानं वितरामि ।

९ वृद्धः .... तण्डुलं वितरति ।

१० भूपतिः .... असिं वितरति ।

16
පාඩම
षोडषः पाठः

අනාගත කාල (ලෘට්) ක්‍රියා වරනැඟීම

16.1 ක්‍රියාකාරකම

අනාගත කාල (ලෘට්) ක්‍රියාපද වාචෝද්ගත කරමු.

पुरुष	एकवचन	द्विवचन	बहुवचन
प्रथमपुरुष	भविष्यति වන්නේ ය	भविष्यतः දෙදෙන වන්නාහ	भविष्यन्ति වන්නාහ
मध्यमपुरुष	भविष्यसि වන්නෙහි	भविष्यथः දෙදෙන වන්නෙහු	भविष्यथ වන්නෙහු
उत्तमपुरुष	भविष्यामि වන්නෙමි	भविष्यावः දෙදෙන වන්නෙමු	भविष्यामः වන්නෙමු

16.2 ක්‍රියාකාරකම

අනාගත කාල ක්‍රියාපද හඳුනා ගෙන වාචෝද්ගත කරමු.

गमिष्यति - යන්නේ ය

लिखिष्यति - ලියන්නේ ය

वसिष्यति - වසන්නේ ය

धाविष्यति - දුවන්නේ ය.

खादिष्यति - කන්නේ ය

क्रीडिष्यति - ක්‍රීඩා කරන්නේ ය

वक्ष्यति - කියන්නේ ය

तरिष्यति - තරණය කරන්නේ ය

नमिष्यति - වඳින්නේ ය

पठिष्यति - පාඩම් කරන්නේ ය

16.1 අභ්‍යාසය

පහත සඳහන් සිංහල වාක්‍ය සංස්කෘතයට පරිවර්තනය කර අතීත හා අනාගත කාලයට හරවා ලියන්න.

1. ඔහු ගමට යයි.
2. මුනිවරයා අසපුවට යයි.
3. ළමයා ක්‍රීඩා කරයි.
4. වඳුරා ගෙඩිය කයි.
5. ඔහු කන්ද තරණය කරයි.
6. මම බුදුන් වඳිමි.
7. උපාසකයෝ බුදුන් වඳිති.
8. නුඹ ලියුමක් ලියහි.
9. අශ්වයෝ දෙදෙන දුවත්.
10. ශිෂ්‍යයා පොත පාඩම් කරයි.

ෂෂ්ඨී, සප්තමී පද හඳුනාගනිමු.

❖ යමක හෝ යමකුගේ **අයිතිය** ප්‍රකාශ කිරීමට අවශ්‍ය වූ විට එය ෂෂ්ඨී විභක්තියෙන් යෙදේ.

උදාහරණ:- **वृक्षस्य फलम्।** - ගසේ ගෙඩිය

भूपालस्य रथः। - රජතුමාගේ රථය





❖ කර්තෘ විසින් කරනු ලබන ක්‍රියාව සිදු කිරීමට **ආධාර වන ස්ථානය** ප්‍රකාශ කරනු ලබන්නේ සප්තමී විභක්තියෙනි.

උදාහරණ:- **विहगः कोटरे वसति।**

කුරුල්ලා බෙනයෙහි වාසය කරයි.

हस्ते प्रदीपम् अस्ति।

අතෙහි පහනක් ඇත.





16.2 අභ්‍යාසය

පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලයට නඟන්න.

१ बालकस्य हस्ते पुस्तकम् अस्ति ।

२ शकुनाः आकाशे सञ्चरन्ति ।

३ मार्गेषु रथाः चलन्ति ।

४ वृक्षेषु विहगाः तिष्ठन्ति ।

५ वने गजाः चरन्ति ।

६ बालकाः उद्यानेषु क्रीडन्ति ।

७ यती आश्रमयोः जीवतः ।

८ विहगाः नीडेषु वसन्ति ।

९ देवस्य मन्दिरं विलसति ।

१० बालकानां गृहेषु वस्त्राणि सन्ति ।

17 පාඩම
सप्तदशः पाठः

නාම වරනැඟීම - VI
(උකාරාන්ත පුරුෂලිංග गुरु ශබ්දය)

17.1 ක්‍රියාකාරකම

උකාරාන්ත පුරුෂලිංග **गुरु** ශබ්දය වාචෝද්ගත කරමු.

विभक्ति	एकवचन	द्विवचन	बहुवचन
प्रथमा	गुरुः	गुरू	गुरवः
सम्बोधन	हे गुरो	हे गुरू	हे गुरवः
द्वितीया	गुरुम्	गुरू	गुरून्
तृतीया	गुरुणा	गुरुभ्याम्	गुरुभिः
चतुर्थी	गुरवे	गुरुभ्याम्	गुरुभ्यः
पञ्चमी	गुरो :	गुरुभ्याम्	गुरुभ्यः
षष्ठी	गुरोः	गुर्वोः	गुरूणाम्
सप्तमी	गुरौ	गुर्वोः	गुरुषु

17.2 ක්‍රියාකාරකම

गुरु ශබ්දයට සමාන ශබ්ද වරනඟා වාචෝද්ගත කරමු.

गुरु - ගුරුවරයා
परशु - පොරොව
साधु - සත්පුරුෂයා
वायु - සුළඟ
शिशु - ළදරුවා
पांशु - පස්

प्रभु	-	ප්‍රභූවරයා	इन्दु	-	සඳ
सूनु	-	පුතා	जन्तु	-	සත්ත්වයා
बन्धु	-	නෑයා	सेतु	-	පාලම
शत्रु	-	සතුරා	केतु	-	කොඩිය
तरु	-	ගස	भानु	-	සූර්යයා
इक्षु	-	උක්ගස	राहु	-	රාහු
विष्णु	-	විෂ්ණු දෙවියා	शम्भु	-	ඊශ්වරයා

17.1 අභ්‍යාසය

පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලයට පරිවර්තනය කරන්න.

१ साधवः धर्मम् उपदिशन्ति ।

२ जनकः शिशुं लालयति ।

३ सारमेयः इन्दुं भषति ।

४ कपी तरुम् आरोहतः ।

५ बन्धुः गृहम् आगच्छति ।

६ कुमारः उदये भानुं पश्यति ।

७ पण्डितः सेतोः पतति ।

८ तरोः पत्राणि वायुना पतन्ति ।

९ शिष्याः गुरवे उपहारं वितरन्ति ।

१० शिष्याः गुरूणाम् उपदेशम् अनुतिष्ठन्ति ।

17.2 අභ්‍යාසය

පහත සඳහන් සිංහල වාක්‍ය අතීත හා අනාගත කාලවලට හරවා සංස්කෘතයට පරිවර්තනය කරන්න.

1. සතුරා දුවයි.
2. පුතා එයි.
3. හිරු බබළයි.
4. ගස පලදරයි.
5. ප්‍රභූවරයා කියයි.
6. සත්පුරුෂයා වඳියි.
7. නෑයා නික්මෙයි.
8. ළදරුවා සිනාසෙයි.
9. පොරොව වැටෙයි.
10. ගුරුවරයා උ ගන්වයි.

17.3 අභ්‍යාසය

පහත සඳහන් වචනවල විභක්තිය, වචනය සහ තේරුම ලියන්න.

	විභක්තිය	වචනය	තේරුම
१ धनिकैः	....	....	....
२ वृक्षे	....	....	....
३ कुक्कुटेभ्यः	....	....	....

४ अरये	....	....	....
५ रवेः	....	....	....
६ गिरौ	....	....	....
७ कपिभिः	....	....	....
८ अलीन्	....	....	....
९ गुरवः	....	....	....
१० बाहुभ्याम्	....	....	....
११ तरुषु	....	....	....
१२ साधवे	....	....	....
१३ शत्रूणाम्	....	....	....
१४ वायुना	....	....	....
१५ शिश्योः	....	....	....
१६ प्रभुम्	....	....	....

17.4 අභ්‍යාසය

❖ 17.1 රූපය ආශ්‍රයෙන් උකාරාන්ත නාම පද **පහක්** ලියන්න.

❖ එම රූපය ආශ්‍රයෙන් සංස්කෘත වාක්‍ය **පහක්** ලියන්න.



17.1 රූපය

18 පාඩම
अष्टादशः पाठः

ශ්ලෝක වාචෝද්ගත කිරීම

18.1 ක්‍රියාකාරකම

පහත දැක්වෙන ශ්ලෝක කියවා වාචෝද්ගත කරන්න.

रविश्चन्द्रो घना वृक्षाः	හිරු, සඳු, වැහි වළා, ගස්
नदी गावश्च सज्जनाः।	ගංගා, ගව, සත්පුරුෂයෝ
एते परोपकाराय	මේවා පර උපකාරෙට
भुवि दैवेन निर्मिताः॥	ලොවැ දෛවය නිමවූවා
उदबिन्दुनिपातेन	දිය බිඳු එක එක එකතු ව
क्रमशः पूर्यते घठः।	ක්‍රමයෙන් කළගෙඩිය පිරේ
स हेतुः सर्वविद्यानाम्	සියලු දැනුම එකතු වෙලා
धर्मस्य च धनस्य च॥	දහම ද ධනය ද ලැබේවි
त्यज दुर्जनसंसर्गं	දුදන ඇසුර අත්හරින්න
भज साधुसमागमम्।	සුදනන් හා එකතුවන්න
कुरु पुण्यमहोरात्रम्	දිවා රැයේ පින් කරන්න
स्मर नित्यमनित्यताम्॥	නිති අනියත බව සිතන්න

පළමු හා දෙවන පාඩම්වල පින්තූර මගින් ප්‍රකාශිත අරුත් සහිත වචන මාලාව

अम्बा	-	අම්මා	अजगरः	-	පිඹුරා
अगारम्	-	ගෙය	इन्दुः	-	සඳ
इभः	-	ඇතා	इभारिः	-	සිංහයා
आरामः	-	ආරාමය	आकाशः	-	අහස
आपणः	-	කඩය	ईहामृगः	-	නරියා
ईर्वारुः	-	වට්ටක්කා	ईश्वरः	-	ඊශ්වරයා
उटजः	-	පැල	उद्यानम्	-	උයන
उण्डेरकः	-	පාන්	ऊषणः	-	ගම්මිරිස්
ऊहिनी	-	කොස්ස	ऊर्मिका	-	මුද්ද
ऋषिः	-	ඍෂිවරයා	ऋक्षः	-	වලසා
ऋष्टिः	-	හෙල්ලය	लृः	-	පොළොව
एरण्डः	-	එරඬු	एलकः	-	එළුවා
एणकः	-	කලු මුවා	ऐरावणः	-	ඇතා
ऐन्द्रिः	-	කාක්කා	ऐक्षवः	-	සීනි
ओकणः	-	මකුණා	ओतुः	-	බළලා
ओदनः	-	බත්	औदनिकः	-	අරක්කැමියා
औषधम्	-	බෙහෙත්	औलूकः	-	බකමූණු රැල
कन्दुकः	-	පන්දුව	कदरः	-	කියත
कपालः	-	හිස්කබල	खनित्रम्	-	උදැල්ල
खगः	-	කුරුල්ලා	खर्जूरक	-	ගෝනුස්සා
गजः	-	ඇතා	गन्धवाही	-	නාසය
गर्दभः	-	කොටළුවා	घटः	-	කළය
घण्टा	-	ඝණ්ටාරය	घरः	-	නිවස
चक्रम्	-	රෝදය	चटकः	-	ගේකුරුල්ලා
चन्द्रः	-	හඳ	छत्रम्	-	කුඩය
छगलकः	-	එළුවා	छत्रिन्	-	කරණවෑමියා
जलाशयः	-	ජලාශය	जनकः	-	පියා
जननी	-	මව	झरः	-	දියඇල්ල

झषः	- ලොකු මාළුවා	झम्पाकः	- වඳුරා
टङ्कः	- පොරව	टंगम्	- සවල
टङ्कन	- කාසිය	ठक्कुरः	- දේවපිළිමය
ठक्कः	- වෙළෙන්දා	डयनम्	- දෝලාව
डमरुः	- කුඩාබෙරය	ढक्का	- ලොකුබෙරය
ढः	- බල්ලා	तक्षकः	- වඩුවා
तटिनी	- නදිය	तनुजा	- දුව
थः	- කන්ද	दधिफलम्	- දිවුල්
दम्पती	- නව යුවළ	दर्पणः	- කණ්ණාඩිය
धनुः	- දුන්න	धर्मराजा	- බුදුරජ
धर्मशाला	- ධර්මශාලාව	नकुलः	- මුගටියා
नक्रः	- කිඹුලා	नटः	- නළුවා
पयोनिधिः	- මුහුද	पंकजम्	- නෙළුම
पत्रम्	- කොළය	फणधरः	- නයා
फलम्	- ගෙඩිය	फलकम्	- පුවරුව
बकः	- කොකා	बटुः	- කොලුවා
बलिवर्दः	- ගොනා	भटः	- සෙබළා
भरुजः	- නරියා	भल्लकः	- වළසා
मकुटम्	- ඔටුන්න	मण्डपः	- මණ්ඩපය
मत्स्यः	- මාළුවා	यतिः	- භික්ෂුව
यष्टिः	- සැරයටිය	यन्त्रम्	- යන්ත්‍රය
रदनः	- දත	रज्जुः	- ළණුව
रत्नम्	- මැණික	लङ्का	- ලංකාව
लता	- වැල	ललना	- ලලනාව
वंशः	- උණගස	वल्मीकः	- තුඹස
वणिजः	- වෙළෙන්දා	शकटम्	- කරත්තය
शकुनः	- කුරුල්ලා	शयनम्	- ඇඳ
षट्चरणः	- මීමැස්සා	षण्मुखः	- කතරගම දෙවිඳු
षष्टिः	- හැට	सदनम्	- ගෙය
सरः	- විල	सन्देशः	- ලියුම
हंसः	- හංසයා	हस्तिदन्तः	- ඇත් දළය
हस्तः	- අත		